## පළමුවන කියැවීම

මීකා 5:1-4

මීකා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**ඉශ්රායෙල් කෙරෙහි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැගී එන්නේ ය.**

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක. "එම්බා බෙත්ලෙහෙම් එප්‍රාතා! තී ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප වන්නෙහි ය. එහෙත්, ඉශ්රායෙල් කෙරෙහි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැගී එන්නේ ය. එතුමන්ගේ පෙළපතේ මුල දුරාතීතයෙන් ද පැරණි යුගයෙන් ද එන්නකි.' එබැවින් ගැබ්ගෙන සිටින ස්ත්‍රීය දරුවෙකු බිහි කරන තෙක් සමිඳාණන් වහන්සේ සිය සෙනඟ සතුරන්ට පාවා දෙන සේක. එවිට ඔවුන්ගේ සහෝදරියන්ගෙන් ඉතිරි කුඩා පිරිස ඔවුන්ගේ සෙනඟ සමඟ එක් වන්නෝ ය. එතුමන් පැමිණි විට, සමිඳාණන් වහන්සේගෙන් ලැබෙන ශක්තියෙන් ද දෙවි සමිඳාණන් වහන්සේගේ නාමයේ මහිමයෙන් ද සිය සෙනඟ පෝෂණය කරනු ඇත. පොළෝ තල වැසියන් සියලු දෙනා එතුමන්ගේ පාලනය පිළිගන්නා බැවින්, එතුමන්ගේ සෙනඟ ආරක්ෂා සහිතව සිටින්නෝ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 80:1-2, 14-15, 17-18

පිළිතුර: අහෝ දෙවිඳුනි, අප මිදෙන පිණිස ඔබේ සිරි වත සිරිය අපට පෙන්වුව මැනව.

ගීය: ඉශ්රායෙල්වරුන්ගේ එඬේරාණෙනි, අපට සවන් දුන මැනව. කෙරුබ්වරුන් මත අසුන් අරා දර්ශනය වුව මැනව. අප මුදා ගැනීමට වැඩිය මැනව

අහෝ සව් බලැති දෙවිඳුනි. අප වෙත හැරුණ මැනව. සඟලොව සිට නෙත් යොමා බලා මේ මිදිවැල වන අප රැක ගත මැනව. ඔබේ දකුණතින් රෝපණය කළ දේ සැලකුව මැනව. ඔබට ම සවිමත් කර ගත් දේ බැලුව මැනව.

ඔබේ හස්තය ඔබේ දකුණු පස සිටින මිනිසා කෙරෙහි පතිත වේවා! ඔබේ යහපතට ඔබ ම සවි ශක්තිමත් කළ ජාතිය කෙරෙහි එය පහළ වේවා! එවිට අපි කවදාවත් ඔබට පිටුපා නොයන්නෙමු. අපට ජිවත් වීමට ඉඩ දුන මැනව. අපි ඔබේ නාමයෙන් අයැද ඔබ පසසන්නෙමු.

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 10:5-10

හෙබ්‍රෙව් වරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.

**"මෙන්න, ඔබගේ කැමැත්ත කරන්නට මම පැමිණ සිටිමි."**

එහෙයින්, ක්‍රිස්තුස් වහන්සේ ලෝකයට වඩින කල දෙවියන් වහන්සේට මෙසේ වදාළ සේක: "ඔබට පුද පඬුරු රිසි නැත. එහෙත් ඔබ මට සිරුරක් සූදානම් කළ සේක. දවන පූජා හා පාප පූජා කිසිත් ඔබ සිත් නොගනියි, එසේ හෙයින්: දෙවිඳුනි. පොත් වෙළුමේ මා ගැන ලියා ඇති සේ, ඔබ රිසි දේ කරනු වස් මෙන්න, මම ඇවිත් සිටිමි. ව්‍යවස්ථාව අනුව ඔප්පු කරන පුද පඬුරුවලටත්, දවන පූජාවලටත්, පාප පූජාවලටත් ඔබ කැමති වන්නේ වත් සතුටු වන්නේ වත් නැතැ"යි ඉහත කියා: "මෙන්න, ඔබගේ කැමැත්ත කරන්නට මම පැමිණ සිටිමි"යි උන්වහන්සේ දෙවෙනුව

වදාල සේක. උන් වහන්සේ දෙවැන්න පිහිටුවන පිණිස පළමුවැන්න අවලංගු කරන සේක. ඒ කැමැත්ත පරිදි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය සදහට ම එක වරක් පූජා කිරීමෙන් අපි පාරිශුද්ධිය ලැබ සිටිමු.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ලූක් 1:38

ආලේලූයා! ආලේලූයා!
බලන්න, මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි.
ඔබ පැවසූ ලෙසම මට සිදු වේවා.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 1:39-45

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මම කවරෙක් ද?"**

දින ගණනකට පසු මරියතුමී නැගිට ජුදා කඳුකරයෙහි නුවරකට යුහුව ගොස්, සෙකරියස්ගේ ගෙට ඇතුළු වී එලිසබෙත් හට ආචාර කළාය. එලිසබෙත් මරියතුමියගේ ආචාර බස් ඇසූ කල ඇගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට වන. එවිට එලිසබෙත් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව මහ හඬින් උදම් අනමින් "ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දීය. ඔබ කුස ඔත් දරු ඵලයද ආශිර්වාද ලද්දේය. මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මම කවරෙක් ද? මක්නිසාද ඔබේ ආචාර හඬ මා සවන් ගත වූ කෙණෙහිම මා කුසෙහි දරුවා ප්‍රීතියෙන් ඉපිලී ගියේ ය. ස්වාමින් වහන්සේගේ නාමයෙන් තමන් හට දුන් පොරොන්දුව ඉටුවන්නේ ම යයි විශ්වාස කල තැනැත්තී භාග්‍යවන්ත ය"යි කීවාය.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.